# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# වයඹ පළාතේ පළාත් සභාව

## 1989 අංක 02 දරණ
## වයඹ පළාතේ හදිසි අවස්ථා
## අරමුදල් ප්‍රඥප්තිය

(අනුමත කළ දිනය: 1989-08-09)

වයඹ පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1992 ජූනි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV අ කොටසේ පළ කරන ලදී.

සතොස මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයෙන් මිළදී ගත හැක.

මිළ : රු. 5/-     තැපැල් ගාස්තුව 1/-

# වයඹ පළාතේ පළාත් සභාවේ
# (1989 අංක 02 දරණ වයඹ පළාතේ හදිසි අවස්ථා අරමුදල් ප්‍රඥප්තිය)

1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 20 (1) වගන්තිය යටතේ වයඹ පළාතේ හදිසි අවස්ථා අරමුදල පිහිටුවීම පිණිසද, ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

| | | |
|---|---|---|
| කෙටි නාමය | 1. | මේ ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 1989 අංක 02 දරණ වයඹ පළාතේ හදිසි අවස්ථා අරමුදල් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය වයඹ පළාතේ ආණ්ඩුකාර වරයා විසින් අනුමත කළ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය. |
| වයඹ පළාතේ හදිසි අවස්ථා අරමුදල | 2. | (1) වයඹ පළාතේ අනපේක්ෂිත වියදම් දැරීමේ අරමුණින් (මෙහි මින්මතු අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන) වයඹ පළාතේ හදිසි අවස්ථා අරමුදලක් මෙයින් පිහිටුවනු ලැබේ. |
| | | (2) රුපියල් දශ ලක්ෂ දෙකක මුදලක් පළාත් අරමුදලෙන් මෙම අරමුදලට බැර කළයුතු අතර, එම මුදල අරමුදලේ කොටසක් විය යුතුය. |
| | | (3) වයඹ පළාතේ පළාත් සභාව විසින් සම්පාදිත ප්‍රඥප්ති මගින් කලින් කලට තීරණය කරනු ලබන සියළු මුදල් මෙම අරමුදලට බැර කළයුතුය. |
| අරමුදලෙන් අත්තිකාරම් ගෙවීම 20 (2) වගන්තිය අනුව විය යුතුය. | 3. | අරමුදලෙන් අත්තිකාරම් ගෙවීමේදී 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 20 (2) වන උප වගන්තියේ දක්වෙන විධිවිධාන අනුගමනය කළ යුතුය. |
| අරමුදලේ භාරකාරත්වය ආණ්ඩුකාරවරයා යටතේ විය යුතුය. | 4. | අරමුදලේ භාරකාරත්වය ආණ්ඩුකාරවරයා යටතේ විය යුතු අතර, ඉන් කෙරෙන සියළු අත්තිකාරම් ගෙවීම් ඔහු අතින් සිදුවිය යුතුය. |